**මාසික විශේෂාංගය - පුරා විද්‍යාව**

# මහියංගණේ ධාතුගර්භයෙන් බිතුසිතුවම් හමුවෙයි

**ආචාර්ය සෙනරත් පරණවිතානයන් ගේ 1951 පුරාවිද්‍යා පාලන වාර්තාවෙන් උපුටාගන්නා ලදී**

මහියංගන වෙහෙරෙහි විවෘත කළ ධාතුගර්භය ඒ වෙහෙර මුලින් ම තැනූ අවදියට අයත් නොවේ. දගැබ් පදනමේ සිට අඩි 22 ක් ඉහළින් ස්ථිරව යෙදූ පැරණි ගඩොල් බැම්ම මතුපිට මේ ධාතුගර්භය පිහිටියේ ය. ඒ අවට බුරුල් පස් හා ගඩොල් කැබලි ද වූ බැවින් ඒ ගර්භය මෑත කාලයක වෙහෙර පිළිසකර කිරීමේ දී තනන ලද්දක් බැව් හැඟෙයි. දිගින් හා පුළුලින් වැඩි විශාල වූ ස්ථිරව යොදන ලද ගඩොල්වල වූ බ්‍රාහ්මී අක්ෂරයන්ගෙන් ඒ බැම්ම කිතු වසින් පෙර කරණ ලද්දක් බැව් නිගමනය කළ හැකි ය.

ධාතුගර්භය වසා ථූපය කළායින් පසුව ඒ ගර්භය මිනිසුන් ගේ ඇසට මෙතාක් යොමුවී නැති බවට සාක්ෂි විය. ගැබ් පියැස්සේ පිහිටි ගල් පුවරු තුන ඉහළ බැම්මේ බරින් පුපුරා තිබුණි. ගර්භය විවෘත කිරීම පිණිස මේ ගල්පුවරු ඉවත් කිරීම ඉතා පරිස්සමින් කළ යුතු විය. එය කැඩී ගර්භය තුළට වැටීමෙන් එහිවූ නිදන් වස්තුන්ට හානියක් වේදෝයි යන බිය නිරන්තරයෙන් ම පැවැතියේ ය. පුරාවිද්‍යා අධිකාරියේ ඡායාරූප ශිල්පී නූර්හමීඩ් රහීම් තලවංස මහතා විසින් එවැනි වැඩෙහි ලබා තිබෙන නිපුණත්වය නිසාම එම කාරිය කිසි අනතුරක් නොමැතිව ඉටුවූයේ ය.

අවුරුදු දහසක් පමණ කාලයකින් පසුව මේ ගර්භයෙහි ප්‍රථමයෙන් ඉවත් කළ එක ගල් කැබැල්ලකින් පමණක් හටගත් විවරයෙන් ඉරඑළිය ගැබ තුළට වැදීමේ හේතුවෙන් එහි පැමිණි දහස් ගණන් සමූහයාට පැරණි ධාතු ගර්භයක වස්තු නිදන් කළ ආකාරය ඇතිසැටියේ ම දර්ශනය විය. ගර්භ බිත්තිවල සිතියම් තිබීම මවිතයට කාරණයක් වූයේ ය. පැරණි ධාතුගර්භ බිතු සිතුවමින් හෙබවූයේ යැයි පොත පතින් අසා තිබුණේ වී නමුත් මේ තාක් එවැන්නක් ඇස් ඉදිරියේ හමු වූ ප්‍රථම අවස්ථාව මෙය වෙයි. ගර්භය වසන ලද ගල් පුවරු සියල්ලම ඉවත් කළ විට පත්ලෙහි විසිරී පැවති බදම කැබලිවලින් නිදන් වස්තු කීපයක් ද වැසී තිබුණේ ය. බදම කැබලිවල වූ චිත්‍රයන් ද ආරක්ෂාකොට නිදන් වස්තු ඒ සුන්බුන්වලින් මතුකර ගැනීම ඉතා පරිස්සමින් කළයුතු වූයේ ය. එදින මහා වර්ෂාපතනයක් ද ඇතිවූ බැවින් එය තවත් දුෂ්කර කාරියක් විය. නිදන් බැලීමට නොඉවසිල්ලෙන් පූල පුලා සිටින මහා ජනකාය අතර ගරු අධ්‍යාපන ඇමැතිවරයාණෝ ද, ගරු මුදල් ඇමතිවරයාණෝ ද, අස්ගිරියේ මහා නායක තෙරුණුවෝද වූහ. මේ සියලු දෙනාම සතුටුවන අයුරින් වැඩි කාලවේලා වක් නොඉක්මවා ධාතු ගර්භයෙහි සුන්බුන් ඉවත්කොට නිදන්ගතව පිහිටි ලෙසම එහිවූ වස්තුන්ගේ ඡායාරූප ගන්නා ලද්දේ ය.

අඩි 4 ක් සම සතරැස් වූ මේ ධාතුගර්භය උසින් අඩි 3කුත් අඟල් 9 ක් ද වෙයි. එහි බිත්ති සතරේ පතුලේ මට්ටමෙහි සිට අඩි 3 ක් ඉහළින් කුඩු සතරක් විය. ඒ කුඩුවක් දිගු පුළුලින් අඩි 2 ක් හා අඩියක් ද වෙයි. එය ගැඹුරින් අඩියකුත් අඟලකි. පතුලෙහි හරි මැද පියනක් සහිත ශෛලමය මඤ්ජුසාවක් විය. එය දිගින් අඩියකුත් අඟල් 8 ක් ද පළලින් අඩියක් හා අඟලක් ද උසින් අඩියකුත් අඟල් භාගයක් ද වෙයි. එයට බස්නාහිරින් ඒ ආකාරම කුඩා මඤ්ජුසාවක් හා මැද මඤ්ජුසාව සතරපස ආරක්ෂක ලෝහමය අසරුවන් සතර දෙනෙක් ද වූහ. ගර්භය සතර කොණ බිත්තියට හේත්තු කළ යකඩ ත්‍රිශූල හතරක් හා යකඩ කූරුවල ඇමුණූ ස්වර්ණමය ධජ සතරක් ද විය. මේ කොත් සතරේ සිට මැද මඤ්ජුසාවේ සතරකොණ දක්වා සතර පේළියකට පිළිවෙළින් තඹ කළසක් ද තඹ පහනක් ද ප්‍රතිපාදනයක් මත පිහිටි සක්ගෙඩියක් ද විය. ගර්භයේ බිත්ති සතර පැත්තේ වූ කුඩුවල බුදුපිළිම හා සක්ගෙඩිය ද විය. ඉහත සඳහන් නිදන් වස්තු සමග කාසි, ආභරණ මැණික් ආදී සැදැහැවතුන් විසින් පූජාකළ භාණ්ඩ විය.

ශෛලමය මඤ්ජුසාව තුළ ථූපාකාර තඹ ධාතු කරඬුවක් විය. විෂ්කම්භයෙන් අඟල් එකහමාරක් වන මේ කරඬුවේ ඝණ්ටාකාර කොත්කැරැල්ල ස්වර්ණමය ඡත්‍රයකින් සමන්විත වෙයි. එවැනිම තවත් කුඩා කරඬුවක් ද එහි විය. කරණ්ඩු පාස්සා තිබුණු බැවින් ඒ අවස්ථාවෙහි දී ඒවා විවෘත කිරීමට නොහැකි විය. පසුව ඒවා විවෘතකර පරීක්ෂාකර බැලීමෙන් එවැනි කරණ්ඩුවල නිදන්කර තිබේ යැයි සැලකෙන දෙයම එහි විය. මඤ්ජුසා ඇතුළේ පැරණි කාසි හා රත්මල් ආදිය ද විය.

ගර්භයෙහි වූ ලෝහමය අසරුවන් සතර දෙනාගේ රූ ලංකාවේ හෝ ඉන්දියාවේ හෝ මේ තාක් සම්බව් ඇති පැරණි වස්තුන්ට සමාන නොවූ කර්මාන්තයෝ ය. කඩුවක් හා පලිහක් ද දැතින් දරා සිටින මේ එක් එක් අසරුවෙකුගේ රූපය පිටුපස ස්ත්‍රී රූපයක් ද වෙයි. විපතකට පත් යුවතියක් එසින් මුදවා ගැනීම මූර්තිමත් කරන අයුරින් මේ රූප කර්මාන්ත කර තිබේ. "දියොස් කොරයි" නම් ග්‍රීක දේව කොට්ඨාශයට සම වූ අස්වින නමැති ඉන්දීය දෙවිවරුන්ගේ රූ ලෙස මේ අසරු රූ හැඳින්විය හැකි ය. කුඩාවල තුබූ කළුපැහැති තද ගලක පෙතැලි බුදුරුවක් විය. එහි පිටුපස පාල සමයේ නාගරී අකුරින් 'යෙ ධම්මා හෙතුප්පභවා' යනාදී පාඨය කොටා තිබේ. මේ බුදු පිළිමය ඉන්දියාවේ ඊශාන දිගින් ලංකාවට ගෙන ආ රූප

අවුරුදු දහසක් පමණ කාලයකින් පසුව
මේ ගර්භයෙහි ප්‍රථමයෙන් ඉවත් කළ
එක ගල් කැබැල්ලකින් පමණක්
හටගත් විවරයෙන්
ඉරඑළිය ගැබ තුළට වැදීමේ හේතුවෙන්
එහි පැමිණි දහස් ගණන් සමූහයාට
පැරණි ධාතු ගර්භයක
වස්තු නිදන් කළ ආකාරය
ඇතිසැටියේ ම දර්ශනය විය.
ගර්භ බිත්තිවල සිතියම් තිබීම
මවිතයට කාරණයක් වූයේ ය.
පැරණි ධාතුගර්භ බිතු සිතුවමින්
හෙබවූයේ යැයි පොත පතින්
අසා තිබුණේ වී නමුත්
මේ තාක් එවැන්නක්
ඇස් ඉදිරියේ හමු වූ
ප්‍රථම අවස්ථාව මෙය වෙයි.

කර්මාන්තයත් බැව් තිසැක ය. එහිවූ තවත් බුදු පිළිමයක් තෙළන ලද්දේ අමරාවතී කිරිගරුඬ පාෂාණයෙනි. රන් අකවල් හා රාජේන්ද්‍රචෝල රජුගේ (ක්‍රි. ව. 1014 – 1044) රිදී කාසියක් ද නිදන් වස්තු අතර විය. මීට වඩා මෑත සමයකට අයත් භාණ්ඩ ගර්භය තුළ නොවී ය. මේ සාක්ෂිය අනුව ධාතු ගර්භය එකොළොස්වැනි සිය වසෙහිදී කරණ ලද්දක් බැව් පිළිගත හැකි ය. මහාවංශය ද (60 පරි. 59 ගා) මේ නිගමනය සනාථ කරයි. එකොළොස් වැනි සියවසෙහිදී ලංකාව සොළීන්ගේ ආධිපත්‍යයෙහි පිහිටි කල දිවයිනේ අතිකුත් පූජනීය ස්ථානයන් මෙන්ම මහියංගන විහාරය ද සොළී හමුදාවන්ගෙන් පීඩා ලබන්නට ඇතුවාට සැක නැත. මහළු විජයබා රජතෙම සිංහල රාජ්‍යය දෙමළුන්ගෙන් මුදගත් පසු බුදුසසුනේ උද්දීප්තිය සඳහා ඔහු කළ වැඩ අතුරෙන් බෞද්ධයන්ගේ මහත් ගෞරවනීය සිඬස්ථානයක් වූ මහියංගනය විහාරය පිළිසකර කරවීම ප්‍රමුඛස්ථානයක් ගත් බව සිතිය හැක. මේ කරුණු අනුව ධාතු ගර්භයෙහි වූ වස්තු එරජු සමයේ දී නිදන් කරණ ලද බැව් පිළිගත හැකිවෙයි. එහි වූ රන් අකවල් හා සමහර වස්තු ඊට පෙර සමයකට අයත් වුවත් ඒවා එකොළොස්වැනි සියවසෙහිදී ව්‍යවහෘතව පැවැත්තේ යැයි සිතිය හැක.

ධාතු ගර්භයෙහි බිතු සිතුවම් සම්බවේයයි කලින් බලාපොරොත්තු නොවූවත් එහි වූ චිත්‍රයන්ගෙන් සෑහෙන තරම් ප්‍රයෝජනයක් ගතහැකි පරිදි ඒවා සකස් කර ගැනීමට පොහොසත් නිලධාරීහු එහි සිටියහ. සිතියම් පිහිටි බදම කැබලි සියල්ලම එකතුකර ඒවායේ ආරක්ෂාව සඳහා තැනට සුදුසු පිළියම් යොදවා කපු පුළුන්වල ඔතන ලදුව කොළඹ පුරාවිද්‍යා අධිකාරිය වෙත ගෙනෙන ලදී. එහිදී තනාගත් තාවකාලික කම්හලකදී ඒවා ශාස්ත්‍රානුකූලව පිළියම් කළායින් පසු ඒ කැබලි සම්බන්ධකර සිතුවම් කීපයක් ම සම්පූර්ණකර ගත්තේ ය. මෙසේ දිවයිනේ පැරණි චිත්‍රකලාව පිළිබඳව ලැබී ඇති නිදසුන් ස්වල්පයට තවත් අගනා සිතුවම් රැසක් එකතුවී ය.

බදම කැබලි ඒකාබද්ධ කිරීමෙන් සකස් කළ එක් සිතියමක් බෝසතුන් බුදුබවට පත්වීමේ දර්ශනය පිළිබිඹු කරයි. බෝමැඩ අසුන් අරා වැඩසිටිනා බුදුරදුන්ගේ දකුණුපස රැවුලක් ඇති සිල්වත් අයෙකුගේ රුවක් වෙයි. බුදුරදුන්ට පූජාසත්කාර කිරීම පිණිස පැමිණි දෙවි බඹුන් අතර විෂ්ණු දෙවියන් දූතකින් මල් බඳුනක් දරාසිටිනා අයුරින් ද ශිවදෙවියන් ත්‍රිශූලය ආදියෙන් සමන්විතව සිටිනා පරිදි ද සිත්තම්කර තිබීම ආශ්වර්යමත් වෙයි. මුඩු හිස් සහිත සිවුරු පොරවන ලද භික්ෂූන්ගේ වැනි රූප ද එහි දැක්වේ. මෙය බුඩත්වයට පැමිණීමේ චිත්‍ර දර්ශනයක් වුවහොත් ඒ රූ බුඩපුත්‍රයන්ගේ වෙන්නට නුපුළුවන. ඒ ඉහළ බ්‍රහ්ම ලෝකයන්හි ශුඩාවාසවල වසන දෙවිවරුන්ගේ රූ යැයි සිතිය හැකියි. මේ රූපයකට ඉහළින් දැක්වෙන කඩුවක් හා පළිහක් ද දැතින් දරා සිටින රුව මාර දිව්‍යපුත්‍රයාගේ චිත්‍ර විය යුතුයි.

සෞන්දර්ය අතින් මේ චිත්‍ර ඉතා උසස් වෙයි. රූපවල ශොභාමත්කම හා වර්ණයන්ගේ ගැලපීම ද රමණීය වේ. කහ මිශ්‍රිත රත, කහ, කළු හා සුදුපාට වර්ණ එහි යොදා ඇත්තේ ය. නිදන් වස්තු අතුරෙන් වඩාම මෑත කාලයට අයිති භාණ්ඩයෙහි වකවානුව මේ සිත්තම් කරන ලද කාලය හා සමවේයයි පිළිගත හැකිවෙයි. ඒ අනුව සිත්තම් එකොළොස්වැනි සියවසට ගැනෙයි. ඇතැම් වියත් කලාරසිකයෝ ඒ චිත්‍ර එකොළොස්වැනි සියවසට පෙර කරනලද ඒවා බැව් පවසත්. නිදන් වස්තු අතර සොළී කාසි හමුවීමට මත්තෙන් පුරාවිද්‍යා අදිකාරිය මගින් ද ඒ චිත්‍ර නවවැනි හෝ දසවැනි සියවසට අයත් වේයයි සලකන ලදී. කලා සම්ප්‍රදාය ලංකාවේ ස්ථාවරව පැවතියේ යයි සැලකූව හොත් එකොළොස් වැනි සියවසෙහි දී කල ලක්දිව චිත්‍ර කර්මාන්තයක් ඉන්දියාවෙහි සත්වැනි හා අටවැනි සියවස්වලට අයත් එබන්දක් සමග සමානකම් ඇතිවෙන්නට හැකි වෙයි. එකොළොස්වැනි සියවසට පෙර මේ සිතුවම් කරණ ලද බවට සාක්ෂියක් බදම කැබලිවලින් අනාවරණය විය. බුඩත්වයට පැමිණීමේ දර්ශනය දැක්වෙන සිතුවම පිහිටි බදම කැබැල්ලෙහි වර්ණයෙන් තොර වූ කුඩා කොටසක් ඉතිරි කොටසට වඩා රළු බවක් හා වෙනසක් ද දක්වයි. සිතුවම් කළායින් පසු කැඩී බිඳී ගිය තැන් පුරවා මේ බදම පිළිසකර කර තිබෙන බැව් එයින් අවබෝධ වෙයි. පළමුවැනි විජයබාහු රජුගේ (ක්‍රි. ව. 1058–1114) සමයට මෑත කාලයකට අයිති භාණ්ඩයක් ධාතු ගර්භයෙහි නොවූ බැවින් ඔහු කල එය සිදුවූයේ යැයි පිළිගත හැකි ය. එසේ නම් ගර්භය හා සිතුවම් ද මෑත අනුරාධපුර සමයෙහිදී කරන ලද බැව් සිතිය හැකියි.

සොළීන්ගෙන් පහර ලැබ වැඩි කලක් ඉකුත්වීමට පෙර ගර්භය හා සිතුවම් ජරාවාසවීමට මත්තෙන් විජයබාහු රජු විසින් දාගැබ පිළිසකර කරන ලද බැව් මේ කරුණුවලින් ඔප්පු වෙයි. පිළිසකර කිරීමේදී අභිනවයෙන් ගර්භයක් තැනීමට වඩා පැරණි ගර්භයම සුරකිව පවත්වාගැනීම වඩාත් පින් සිදුවෙන වැඩක් බැව් එකල වුසු සැදැහැවතුන් අදහස් කරන්නට ඇත.

නිදන්වස්තු සියල්ලම සූද්දකළායින් පසුව ඒවායේ ලේඛනයක් පුරාවිද්‍යා අදිකාරිය මගින් සකස්කරන ලදී. නීත්‍යානුකූලව මහියංගන විහාරයට අයිති ඒ වස්තු දැනට විහාරාධිපතීන් වහන්සේ භාරයේ තිබේ. පුරාවිද්‍යා අදිකාරියේ ද සහාය ඇතුව මහියංගන චෛත්‍ය වර්ධන සමිතිය මගින් මේ වස්තු සියල්ලම බිනර මස පසළොස්වක දින ප්‍රදර්ශනය කරන ලද්දේ ය. ශිල්ප කර්මාන්තය, ප්‍රතිමා විද්‍යාව, ඉතිහාසය යනාදී සෑම අතින් ම වැදගත් වූ මේ වස්තු සම්භාරයට හිමිකම් කියන්නට පොහොසත් මොනයම් ජනතාවකට වුවත් එයින් මහත් ගෞරවයක් සැලසෙන්නේම ය. මහඟු ජාතික වස්තුවක් වූ මේ නිදන් රැස සැදැහැවතුන්ගේ හා ආධුනිකයන්ගේ ද ප්‍රයෝජනය සඳහා සුරකිව දර්ශනය කිරීමට සුදුසු පිළිවෙළක් නොපමාව සැළැස්විය යුතු වෙයි. □

# සීගිරි ගී පළ කළ හැටි

සීගිරි පද පිළිබඳ රචනය අවුරුද්ද අවසානයේ දී (1953) ලියා හමාර කර මුද්‍රණය සඳහා යවන ලද්දේ ය. අට වැනි හා දසවැනි සියවස් අතර ලියැවුණු සිංහල ගී 700 පමණ විස්තර පෙළ අර්ථය හා විවරණ මේ නිබන්ධයෙහි අඩංගු වේ. සිංහල අක්ෂරයන්ගේ පරිණාමය අවබෝධ කර ගැනීමට මේ පද ඉතාම ප්‍රයෝජන වෙයි. එක් එක් අකුරක් එක් එක් අවධියේ දී හැඩ ගැසුණු පිළිවෙළ ඒ අකුරුවල රූප ඇඳීමෙන් විස්තර සහිතව මෙහි (සීගිරි ගී පොතේ) දක්වා ඇත.


මේ නිබන්ධයේ හැඳින්වීමෙහි වැඩි කොටස සීගිරි පදයන්ගේ වියරණ පිළිබඳ කරුණු දැක්වෙයි. ඒ වියරණ විධි අවබෝධ කරගැනීම සඳහා පැරණි සෙල්ලිපි බස සාහිත්‍යය, හා මෙකල බස ද ඉවහල් කර ගන්නා ලද්දේ ය. පැරණි හෙළ බසෙහි වූ වාග් විද්‍යා ව හා වියරණ විධි ගැන ද මෙහි (සීගිරි ගී පොතේ)කරුණු දක් වේ. මෙතෙක් සම්මතව ඇති වියරණ විධි ඒ සඳහා විමසන ලදුව ඉන් සමහරක් සදෙස් බැව් හෙළි වූයෙන් ඉවත ලෑමට ද සිදු විය.

පැරණි වියරණ විධි පැරණි බස ආධාර කොට ගෙන අවබෝධ කරගැනීමය, මෙහි උත්සාහය වූයේ. පැරණි අලුත් දේශීය හා විදේශීය වියරණ කරුවන්ගේ මතයන් සලකා බලන ලද නමුත් මධ්‍යතන යුගයේ වියරණ ක්‍රම සැපයීමට නවීන භාෂානුකූලව සාදන ලද ඒ ක්‍රම ප්‍රයෝජන නොවී ය. පදයන්ගේ අර්ථ පමණක් නොව එහි විරිත් කර්තෘන් පිළිබඳ අගනා කරුණු රැසක් ද ඒ හැඳින්වීමෙහි ඇත. සෑම වචනයකම ප්‍රභවය අර්ථය දැක්වෙන ගැටපද විවරණයක් සහිත පටුනකින් පරිපූර්ණ වන මේ නිබන්ධය සිතුවම් පණහකින් පමණ යුක්ත වේ. මුද්‍රණ පිටු 700 පමණ එහි ඇත්තේ ය.


**(1952 වැන්නේ පුරාවිද්‍යා පුවත – පි. 3–4 පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්)**

සේරු සිතුවම්

# එදා සීගිරිය



සීගිරි පර්වතය උතුරින් පෙනෙන හැටි



බෙල් මහතා සිය බිරිය සහ පුතනුවන් සමග සීගිරි අප්සරාවන් දැක්මට ගිය මුල් කාලය

## සීගිරිය සහ බෙල්




බෙල් මහතා සිය බිරිය සහ පුතනුවන් සමග සීගිරිය නැංග අවස්ථාවක්



බෙල් පවුල සිංහාසනය මත



1896 සීගිරියේ ශ්‍රමිකයෝ



බෙල් පවුල සීගිරි අප්සරාවන් පිටපත් කළ අවස්ථාවක්

# ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය

අනුරාධපුර නගරයේ මතුපිට අඩි 30 ක් පමණ යටින් ක්‍රි. පූ. 900 - 800 පමණ පැරණි ශිෂ්ටාචාරයක නටබුන් සොයා ගෙන ඇත. මහාවංසයේ සඳහන් වන විජයාවතරණයට වසර තුන් හාර සියයකට ඉහත කාලයට මේ යුගය අයත් වන්නේ ය. ම විසින් පසුගිය කාලයේ කරන ලද පර්යේෂණ අනුව යකඩ තාක්ෂණයත්, වී වගාවත්, අශ්වයින් ඇති කිරීම හා ඉතා උසස් වර්ගයේ මැටි බඳුන් නිර්මාණයත් එම අනුරාධපුර සංස්කෘතියට අයත් වී ඇති බැව් පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් පැහැදිලි වී ඇත.

එයින් ප්‍රථම අදියර ලංකාවේ ශිලා යුගයට අවධානය යොමු කරන ලද අතර මේ පිළිබඳව පර්යේෂණ 1984 සිට 1990 වසර දක්වා සිදු කෙරුණි. ලංකාවේ ශිලා යුගය ක්‍රි. පූ. දෙලක්ෂ පනස්දහ සිට ක්‍රි. පූ. දහ දක්වා දිවෙන අතර මේ කාලය පරිච්ඡේදය තුළ දී එකල මිනිසා හා පරිසරය අතර සබඳතාව පිළිබඳ මෙම පර්යේෂණයට භාජනය කරන ලදී. මේ සඳහා ලංකාව තුළ කැණීම් හා දකුණු වෙරළබඩ තීරයේ වැලි කඳු ද කැණීම් වලට භාජනය කරන ලදී. කිතුල්ගල බෙලි ලෙන, කරුවිට බටදොඹලෙන, බුලත්සිංහල පාහියන්ගල ලෙන යන ලෙන්වල පර්යේෂණ කැණීම් කර ඇත. ඊට අමතරව යාල සිට මාන්කුලම දක්වා මුහුදුබඩ වැලිකඳු, ඉරණමඩු සිට විල්පත්තු දක්වාත් වැලිකඳු මෙම පර්යේෂණ කැණීම් සඳහා යොදා ගත්තෙමි.

මෙම පර්යේෂණ මගින් ලංකාවේ ශිලා යුගයේ පැවැති දේශගුණික විපර්යාස රටාවත් ශිලා යුගයේ සංස්කෘතික විකාශනයත් ඒ අතර සබඳතාවත් පිළිබඳව හෙළි කර ඇත. ඒ අනුව එකල ශිලා මෙවලම් තාක්ෂණය, ජනාවාස රටාව මළවුන් ආදාහන කිරීමේ ක්‍රම හා ජීවන පිළිවෙත් මෙන් ම භෞතික මානව විද්‍යාව පිළිබඳව ද පර්යේෂණාත්මක කරුණු රැසක් හෙළිදරව් කර ඇත.

ආදි ශිලා යුගයේ මිනිසා වසර 125,000 පටන් ලංකාවේ ජීවත් වී ඇති බව ප්‍රථම වතාවට මෙම පර්යේෂණ මගින් සොයාගන්නා ලදී. මානව සංස්කෘතික ස්තරයක් පිළිබඳ කරන ලද පර්යේෂණ අනුව මීටත් ඈත කාලයක් වූ වසර 300,00 ත් 500,000 ත් ඈත යුගයක පුරාවිද්‍යාත්මක සාක්ෂි දක්නට ලැබෙනු ඇතැයි සැක කෙරේ.

සබරගමුව පළාතේ ගල්ගුහාවල කැණීම් වලින් ලැබී ඇති ඉතා දියුණු ජ්‍යාමිතික ශිලා මෙවලම් ආයුදු අනුව මීට වසර 30,000 පෙර සිට එම අවි භාවිත කර ඇත. මේ යුගයට අයත් ශිලා මෙවලම් යුරෝපීය රටවලින් ලැබෙන්නේ මීට වසර 12,000 පෙර ඒවා පමණි.

ආදි ශිලා යුගයේ මිනිසා වසර 125,000 පටන් ලංකාවේ ජීවත් වී ඇති බව ප්‍රථම වතාවට මෙම පර්යේෂණ මගින් සොයාගන්නා ලදී. මානව සංස්කෘතික ස්තරයක් පිළිබඳ කරන ලද පර්යේෂණ අනුව මීටත් ඈත කාලයක් වූ වසර 300,00 ත් 500,000 ත් ඈත යුගයක පුරාවිද්‍යාත්මක සාක්ෂි දක්නට ලැබෙනු ඇතැයි සැක කෙරේ.

දිවයිනෙහි වසර 500,000 පමණ ඈත යුගයේ දේශගුණික විපර්යාසයන් පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක දැනට මෙම පර්යේෂණ මගින් හෙළිදරව් කර ඇත. ලංකාවේ ආදි කාලීන දේශගුණික විපර්යාසය පිළිබඳ අධ්‍යනය ගැන විමසා බලන විට එය දකුණු ආසියාතු රටවල මේ පිළිබඳව කෙරුණු මුල් ම අධ්‍යයනයන් අතර මෙය ප්‍රමුඛ වන්නේ ය.

වසර 31,000 ඈත එපිට ලංකාවේ භෞතික මානව වංශ විද්‍යාව පිළිබඳ පර්යේෂණ ඇමරිකා එක්සත් ජනපදයේ කෝනල් විශ්ව විද්‍යාලයේ ද සහභාගිත්වයෙන් සිදුකර ඇත.

තව දුරටත් ඒ අනුව කරන ලද පර්යේෂණ මත ක්‍රි. පූ. 14,000 සිට මෑත භාගයේ දී වැදි පරපුර දක්වා අඛණ්ඩව දිවෙන, සාක්ෂි හමු වී තිබේ.

මෙම අධ්‍යයනය සඳහා නවීනතම ක්‍රම හා තාක්‍ෂණයන් උපයෝගී කරගෙන ඇති අතර මෙවැනි ශිෂ්ටාචාර අධ්‍යයනය සඳහා මෙවැනි ක්‍රම හා තාක්‍ෂණයන් ආසියාවේ යොදාගත් ප්‍රථම අවස්ථාව ද මෙය වන්නේ ය.

ප්‍රාග් ඉතිහාසය පිළිබඳ පර්යේෂණයන්හි දෙවැනි අදියර අනුව ක්‍රි. පූ. 1000 ත් ක්‍රි. පූ. 300 ත් අතර කාලය එම අධ්‍යනයට අදාළ වන අතර එම පර්යේෂණ තවදුරටත් සිදු කෙරෙමින් පවතී. මෙම පර්යේෂණ සඳහා අනුරාධපුරයේ ඇතුල්පුර පැරණි ජනාවාස ප්‍රදේශය වූ ථූපාරාමයට නිරිතදිග විජයබා මාළිගය හා ගෙඩිගෙය ප්‍රදේශයේ කැනීම් සිදු කෙරුණි.

මෙම කැනීම් වලින් භාරතයේ අශෝක අධිරාජ්‍යයාට පූර්වකාලීන අක්ෂර වූ මූල, බ්‍රාහ්මී අක්ෂර කීපයක් ප්‍රථම වතාවට සොයාගෙන ඇත. අනුරාධපුර කැනීම් වලින් සොයාගෙන ඇති මෙම අක්‍ෂර සහිත වලං කැබලි ක්‍රි. පූ. 6 සහ 5 යන සියවස් වලට අයත් සේ සැලකිය හැකිය. මෙම වලං කැබැල්ලක "අනුරද" යන වචනය සඳහන් වෙයි. මේවා මහාවංශයෙහි සඳහන් විජයාවතරණය ඇතුළු උතුරු ඉන්දීය බලපෑ යුගයට අයත් වන්නේය. එම සියවස් දෙකේ දී දියුණු සංස්කෘතියක් තිබුණු බවට කිසිදු සැකයක් නැත.

මේ අනුව ලංකාවේ ඓතිහාසික යුගය ආරම්භ වන්නේ දේවානම්පියතිස්ස රාජ යුගයෙන් නොව ඊට වසර 250 කට පමණ පූර්වයෙන් බැව් නිශ්චිතව ප්‍රකාශ කළ හැකිය. මෙවැනි පැරණි ඉතිහාසයක් ශ්‍රී ලංකාවෙන් හමුවීමත් මේ දක්වා වෙනත් දකුණු ආසියාතු රටකින් දක්නට නොලැබීමත් විශේෂත්වයකි.

ආචාර්ය එෆ්. ආර්. ඒ. ඕලිවින් මහතාගේ පර්යේෂණ අනුව අනුරාධපුර ඇතුල්පුර ඓතිහාසික මුල් යුගයේ ඉන්දියානු කලාපයේ පස්වැනි නගරය වශයෙන් සැලකිය හැකිය. මෙවැනි නගරයකට සැසැඳිය හැකි නගරයක් නැති අතර උතුරු ඉන්දියාවේ උජ්ජේනී නගරයට දකුණෙන් මෙවැනි නගරයක් අනුරාධපුරය හැර හමු නොවනවා පමණක් නොව දකුණු ඉන්දියාවේ මේ දක්වා මෙවැනි නගරයක් බිහිවී නැත්තේය.

ඉදිරි කාලයේදීත් මෙවැනි පුරාවිද්‍යා පර්යේෂණයන් මෙහෙයවීම පිණිස කටයුතු සංවිධානය කරගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙහි පුහුණු කටයුතු කිරීම පිණිස ආචාර්යවරුන්ගේ හිඟයක් පවතී. සිය පාඨමාලා කාලීන වශයෙන් සකස් කිරීම පිණිස විශ්ව විද්‍යාල විසින් කටයුතු කරගෙන යන බව දක්නට ලැබේ. නමුත් ප්‍රධාන ගැටළුව වී ඇත්තේ ඒ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් පුහුණු කිරීම පිණිස ආචාර්යවරුන්ගේ හිඟයයි. මෙම කෙෂත්‍රය තුළ ඉතා දක්‍ෂයින් තෝරා ඒ අයට දීර්ඝකාලීනව විදේශ පුහුණුවක් ලබාදීම පිණිස යටත් පිරිසෙයින් (වසර 3 ක) පහසුකම් සැලසිය යුතුව ඇත. එම පුද්ගලයින් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ අය පුහුණු කිරීම සඳහා පසුව යොදාගත හැකිවන සම්පත් පුද්ගලයින් ද වනු ඇත.

එහෙත් ඉතා විශිෂ්ට ගතයේ පුහුණු නිලධාරීන් ලැබෙන තුරු අපගේ පුරා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති නැවත්විය යුතු යැයි එයින් අදහස් නොවේ.

දැනට අනුරාධපුරයේ ඇතුල් පුරයෙහි මුළු බිම් ප්‍රමාණයෙන් දස දහසකින් එකක් (1/10,000) වත් පර්යේෂණයට භාජනය කර නැත. මෙම පර්යේෂණ සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් ඒ කාර්යයන්හි යෙදෙන තුරු එම ස්ථාන කැනීම් කිරීමෙන් වැළකීම ඉතා සුදුසුයැයි මම කල්පනා කරමි. ❑

27 පිටුවට

# අපේ පුරාවිද්‍යා අතීතය හා අනාගතය


1890 ජූලි මස 7 වැනිද ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් එච්. සී. පී. බෙල් මහතා විසින් ආරම්භ කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව දැනට වසර 109 ක් සපුරා ඇත. මෙම දෙපාර්තමේන්තුවේ පසුගිය පනස් වසර ආරම්භ වන්නේ ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා පුරාවිද්‍යා කොමසාරිස් ලෙස වසර 16 ක සේවා කාලයෙන් අඩක් පමණ ගතවුණු අවස්ථාවේදී ය. මේ යුගය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්වර්ණමය යුගය ලෙසින් සඳහන් කළ යුත්තේ මහජනතාව තුළ මෙන් ම රටේ නායකයින් තුළ ද අපේ පැරණි භෞතික උරුමය පිළිබඳ ඉතා දැඩි ප්‍රබෝධයක් පැවති හෙයිනි. ඒ කාලයේ දී පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සංරක්ෂණ, අභිලේඛණ හා ප්‍රකාශන ආදී වශයෙන් වෙන් වෙන්ව අංශ නොතිබුණු නමුදු පුරාවස්තු පිළිබඳව ඒ සියලුම කටයුතු පුරාවිද්‍යා කොමසාරිස්වරයා ගේ පූර්ණ සහභාගීත්වය යටතේ සිදුවූයේ ය. අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය ඇතුළු පුරාවිද්‍යා සංකීර්ණයන්හි සංරක්ෂණ කටයුතු මෙන් ම ඒවා පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද, දේශන පැවැත්වීම් හා විශේෂයෙන් ඒ පිළිබඳ පොතපත ලිවීම ද එම යුගයේ දී කඩිනමින් සිදු විය.

විශේෂයෙන් සඳහන් කළ යුතු ග්‍රන්ථයක් නම් සීගිරි ගී (Sigiri Graffiti) පිළිබඳ ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් ලියන ලද ග්‍රන්ථයයි. ඊට අමතරව



ආචාර්ය
සෙනරත් පරණවිතාන

වාර්ෂිකව ඔහු විසින් ලියන ලද වාර්තා එච්. සී. පී. බෙල් මහතා ගේ යුගයේ දී ලියන ලද වාර්තාවලට වඩා ගැඹුරු ශාස්ත්‍රීය කරුණු වලින් යුක්ත වූයේ ය. ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් එම යුගයේ දී ගුවන් විදුලිය, පුවත්පත් හා විවිධ දේශන මගින් ඔහු සොයාගත් කරුණු ජනතාව අතර ප්‍රචලිත කිරීමෙහි පුරෝගාමී වූයේ ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන පිළිබඳ නිල ප්‍රකාශනය වූ එපිග්‍රැෆියා සිලනිකා ග්‍රන්ථය (Epigraphia Zeylanicaä II, III, IV හා V යන වෙළුම් නිකුත් කිරීමෙන් ඔහු විසින් කරන ලද සේවාව මෙහි දී සඳහන් කළ යුතුව ඇත. ඉංග්‍රිසි බසින් ලියන ලද එම ග්‍රන්ථ දැන් සිංහල භාෂාවට ද පරිවර්තනය කෙරෙමින් පවතී. 1950 ගණන්වල දී වල්ලිපුරම් රන්පත සොයාගැනීම ද සිංහල ශිෂ්ටාචාරය හා රාජධානිය යාපනේ පැවති ආකාරය පිළිබඳව ඉතා වැදගත් සාක්ෂියකි. මීට අමතරව අනුරාධපුර රුවන්වැලි සෑය, දීඝවාපි චෛත්‍යය, මහියංගන, මිහින්තලේ ආදී චෛත්‍ය සංරක්ෂණය ද මෙකල සිදු වූ වැදගත් කාර්යයන් සේ සැලකිය හැකි ය. 1956 දී ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා පුරාවිද්‍යා කොමසාරිස් පදවියෙන් විශ්‍රාම යාමත් සමගම වැඩ බැලීමේ තනතුර සඳහා සෙන්සියරි මහතා පත්වූයේ ය. ඉන්පසු වසරක පමණ කාලයක් එවකට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාරය පී. ඊ. පී. දැරණියගල මහතා පුරාවිද්‍යා කොමසාරිස් තනතුරේ වැඩ බැලුවේ ය. එම යුගයේ දී ලංකාවේ ප්‍රාග්



ආචාර්ය
චාල්ස් ගොඩකුඹුර

ඉතිහාසය පිළිබඳ අවධානයක් යොමු කරවන ලදී. ඉන් පසුව ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා කොමසාරිස් ලෙසින් සේවය කළේ ය. එම යුගයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයක් ඇති කර එය ගවේෂණ අංශයට සම්බන්ධ කළේ ය. ඒ සමගම කැණීම් අංශයක් ද ඇති කළේ ය. ඉන්පසුව සහකාර කොමසාරිස් ප්‍රකාශන හා ගවේෂණ මෙන් ම කැණීම් පිළිබඳව සහකාර කොමසාරිස් තනතුරක් ද ඇති කළේ ය. මේ යුගයේ දී දැදිගම කොටවෙහෙර ස්ථානයේ දී කරන ලද කැණීම් මගින් එම ස්ථානය මහා පරාක්‍රමබාහු රජු උපන් ස්ථානයේ ඉදි කළ සූතිඝර චෛතිය බව සාක්ෂි සහිතව ඔප්පු වූයේ ය. ආචාර්ය ගොඩකුඹුර මහතා විසින් ඒන්ෂන්ට් සිලෝන් නම් වාර ප්‍රකාශනයක් ද ආරම්භ කරන ලදී. එම ග්‍රන්ථයේ දැනට වෙළුම් 12 ක් නිකුත් කර ඇත. එම යුගයේ දී ද පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ දැඩි අවධානයක් ජනතාව අතර ඇති වූයේ ය.

විශේෂයෙන් ම මුල්කාලීන බ්‍රාහ්මී සෙල්ලිපි පිළිබඳව මහාචාර්ය සෙරත් පරණවිතාන මහතා විසින් ලියන ලද ඉන්ස්ක්‍රිප්ෂන්ස් ඔෆ් සිලෝන් 1 වෙළුම (Inscriptions of Ceylon) ග්‍රන්ථය 1970 දී ප්‍රකාශයට පත් කරන ලද්දේ ගොඩකුඹුර මහතාගේ උත්සාහයෙනි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගිය ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ඉන් පසුව ලංකා විශ්ව විද්‍යාලයේ - පුරාවිද්‍යා අංශයක් ඇතිකර එහි මහාචාර්යවරයා ලෙසින් පත්වීම ද පුරාවිද්‍යා විෂය විශ්ව විද්‍යාලයන් තුළ ව්‍යාප්තවීමේ ආරම්භක අවස්ථාව වශයෙන් සනිටුහන් කළ හැකි ය. ආචාර්ය ගොඩකුඹුර මහතා විසින් ද පොදු ජනතාව අතර පුරාවස්තු පිළිබඳ

මෙම දෙපාර්තමේන්තුවේ පසුගිය පනස් වසර ආරම්භ වන්නේ ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා පුරාවිද්‍යා කොමසාරිස් ලෙස වසර 16 ක සේවා කාලයෙන් අඩක් පමණ ගතවුණු අවස්ථාවේදී ය. මේ යුගය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්වර්ණමය යුගය ලෙසින් සඳහන් කළ යුත්තේ මහජනතාව තුළ මෙන් ම රටේ නායකයින් තුළ ද අපේ පැරණි භෞතික උරුමය පිළිබඳ ඉතා දැඩි ප්‍රබෝධයක් පැවති හෙයිනි. ඒ කාලයේ දී පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සංරක්ෂණ, අභිලේඛණ හා ප්‍රකාශන ආදී වශයෙන් වෙන් වෙන්ව අංශ නොතිබුණු නමුදු පුරාවස්තු පිළිබඳව ඒ සියළුම කටයුතු පුරාවිද්‍යා කොමසාරිස්වරයා ගේ පූර්ණ සහභාගිත්වය යටතේ සිදුවූයේ ය.

අවබෝධයක් ලබාදීම සඳහා සදකඩ පහන, මුරගල, බුදු පිළිමය ආදී ග්‍රන්ථ 12ක් හා තවත් ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසක් ලියා පළ කරන ලදී. ඉන්පසු එළඹියේ, ආචාර්ය රාජා ද සිල්වා මහතාගේ යුගයයි. එම යුගයේදී ද පුරා විද්‍යා ක්ෂේත්‍රය තුළ විශේෂිත සිදුවීම් රැසක් ම සිදුවූයේ ය. විශේෂයෙන්ම ඊට ඉහත දී සිදු වූ සීගිරි චිත්‍ර විනාශ කිරීමෙන් සිදු වූ හානිය වැළැක්වීම පිණිස ඔහු විසින් මෙහෙවරක් ඉටු කරන ලදී. ඉතාලියේ ලුසියානෝ මරාන්සි නම් විශේෂඥවරයාගේ ද සහාය මේ සඳහා ලබා ගන්නා ලදී. අනතුරුව එළඹියේ ආචාර්ය සද්ධා මංගල කරුණාරත්න මහතා පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත්වීමයි. මේ කාලයේ දී යුනෙස්කෝවේ ද සහභාගීත්වය යටතේ, මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීමේ සාකච්ඡා ආරම්භ වූයේ ය. ඔහුගේ කාලයේ සිදුවූ ඉතා වැදගත් සිදුවීමක් ලෙසින් තිරියායේ වටදාගෙය අසල තිබී හමු වූ මහායාන බෝධිසත්ව ලෝකඩ පිළිම හා බුදු පිළිම සුවිශේෂ වැදගත්කමක් දරණු ඇත. මීට ඉහතදී ද බෝධි සත්ව පිළිමයක් (රන් ආලේපිත) ලැබී තිබුණි. මෙහි දී ලෝකඩ බුදු පිළිම ද තවත් ලෝකඩ කරඬු ද රැසක් ම හමු වූයේ ය. 1980 වර්ෂයේ දී පුරා විද්‍යා ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අමතරව තවත් කාර්යාංශයක් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ම ඇති කරන ලදී. එය සංස්කෘතික ත්‍රිකෝණය නමින් හැඳින් වේ. අනුරාධපුරය, පොළොන්නරුව, හා මහනුවර ස්ථාන පිළිබඳ කරන ලද ත්‍රිකෝණය අනුබද්ධ වූ විශේෂිත ව්‍යාපෘති හයක් මේ යටතේ ක්‍රියාත්මක වූයේය. ඒ සඳහා ද අධ්‍යකෂක ජනරාල්වරයෙකු පත් කරන ලදී. ඔහු ආචාර්ය රොලන්ඩ් සිල්වා මහතා ය. ඔහු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ද කොමරාරිස්වරයා ලෙසින් 1983 සිට 1990 දක්වා සේවය කළේ ය.


මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘති සඳහා අනුරාධපුරයේ අභයගිරිය, ජේතවනාරාමය, පොළොන්නරුවේ ආලාහන පිරිවෙන, සීගිරිය හා දඹුල්ල ද මහනුවර දළදා මාළිගය හා ආශ්‍රිත ප්‍රදේශය ද මේ ව්‍යාපෘතියට ඇතුළත් ය. මෙම ස්ථාන ලෝක සංස්කෘතික උරුම ලැයිස්තුවට ද යුනෙස්කෝව මගින් ඇතුළත් කිරීම සුවිශේෂ සිද්ධියක් ලෙසින් සඳහන් කළ යුතුව ඇත. මේ කාලයේ දී ජේතවනාරාමය දාගැබ අසලින් කැණීමක දී රන් පත් ඉරු හමුවීම ද විශේෂ සිද්ධියකි. එය මහායාන බුදු සමයේ ප්‍රඥාමිතා සූත්‍රයට අයත් වූ



ආචාර්ය
රොලන්ඩ් සිල්වා

ග්‍රන්ථයකි. අට වැනි සියවසේ සිංහල අක්ෂර වලින් ලියන ලද, එම ග්‍රන්ථය සංස්කෘත භාෂාවෙන් ලියන ලද්දකි.

පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සුවිශේෂ වසරක් ලෙසින් 1990 වර්ෂය හඳුන්වාදිය හැකි ය. එම වර්ෂයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවා වසර සියයක් සපිරුණි. ඒ නිමිත්තෙන් රටවල් විස්සක පමණ පුරාවිද්‍යාඥයින් හා ඉතිහාසඥයින්ගේ පුරාවිද්‍යා ජාත්‍යන්තර සමුළුවක් (දින



ආචාර්ය
එම්. එච්. සිරිසෝම

හතක) කොළඹ දී පවත්වන ලදී. ප්‍රතිසංවිධානය යටතේ පුරාවිද්‍යා කොමසාරිස් ධුරය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් යනුවෙන් නම් කරන ලද අතර පුරා විද්‍යා දෙපාර්තමේන්තුව පොදු සේවා, අභිලේඛන හා නාණක විද්‍යා, වාස්තු විද්‍යා සංරක්ෂණ, රසායනික සංරක්ෂණ, කැණීම් හා කෞතුකාගාර, ගවේෂණ හා ලියාපදිංචි කිරීම් හා නඩත්තු හා පොදු සේවා වශයෙන් අංශ හතකට බෙදා ක්‍රියාත්මක කරන ලදී. 1990 වර්ෂයේ දී සිදු වූ තවත් සුවිශේෂ සිද්ධීන් ලෙසින් මාලිගාවිල මෙතෙක් විනාශ වී තිබූ බුදුපිළිමයත්, දඹේගොඩ විනාශ වී තිබූ අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමයත් නගා සිටුවීම සඳහන් කළ හැකි ය.

ආචාර්ය රොලන්ඩ් සිල්වා මහතා විශ්‍රාම යාමෙන් පසුව 1991 සිට 1992 දක්වා ඇම්. එච්. සිරිසෝම මහතා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කළේ ය. ඔහු පරණවිතාන, ගොඩකුඹුර වැනි පුරාවිද්‍යාඥයින් යටතේ පුහුණුව ලද විද්‍යාඥයෙකි. පුරාවිද්‍යා කටයුතු



ආචාර්ය සද්ධා මංගල
කරුණාරත්න

පිළිබඳ රූපවාහිනී මගින් මෙන් ම දේශන මගින් ද ජනතාව දැනුවත් කිරීමේ කාර්යය ඔහු විසින් සිදු කරන ලදී. ඔහු සහකාර කොමසාරිස්වරයකුව සිටින කාලයේ දී සත්සෝනි කොමිසම ඉදිරියේ දුන් සාක්ෂි ද ඔහුගේ පුරාවිද්‍යා දැනුම ප්‍රකට කරවන්නකි.

වත්මන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයා පත්වූයේ 1992 නොවැම්බර් 24 වැනිද ඇම්. එච්. සිරිසෝම මහතාගේ හදිසි අභාවයෙන් පසුව ය. මේ කාලය තුළ දී මිරිසවැටිය දාගැබ යළි සංරක්ෂණය කිරීමත්, විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. නවද පුරාවිද්‍යා ආඥාපනත 1998 දී සංශෝධනය කිරීමෙන් පසුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලතල පුළුල් කළේ ය. මේ අනුව මෙතෙක් ඉතා ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පැවති පුරාවස්තු විනාශ කරන්නන්ට එරෙහි වූ දඬුවම් වසර 2 සිට 5 දක්වා වැඩි කරන ලද අතර දඩය රුපියල් පනස් දහස දක්වා වැඩි කරන ලදී. මේ දඩය හා සිර දඬුවම් ප්‍රමාණය තවත් වැඩි කිරීමට යෝජිත ය.

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට පුරාවස්තු ආරක්ෂා කිරීම සඳහා 1998 ආඥාපනත යටතේ වැඩි බලතල පවරන ලදී. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආරක්ෂක කමිටු ද පිහිටුවන ලද අතර දිස්ත්‍රික්කවල සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් විදුහල්පතිවරුන් හා ආගමික නායකයින් මේ පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ ද පවත්වන ලදී.

පුරාවස්තු විනාශ කිරීම මැඩපැවැත්වීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එච්. එම්. ජේ. බී. කොටකදෙණිය මහතාගේ ප්‍රධානත්වයෙන් වෙනම අංශයක් ද පිහිටුවන ලදී.

පුරාවස්තු සොරකම් කර පිටරට ගෙනයාම වැළැක්වීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සහාය ලබාගෙන ඒ පිළිබඳ අධීක්ෂණය සඳහා අංශයක් ද ක්‍රියාත්මක කෙරේ. වර්තමාන සංවර්ධන ක්‍රියාවලිය යටතේ පුරාවස්තු විනාශය වැළැක්වීම පිණිස කිසියම් සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර එම භූමියේ පුරාවස්තු පිළිබඳ මූලික වාර්තාවක් එහි ගවේෂණයෙන් පසුව ලබාදිය යුතු බවට ඉහත සඳහන් පුරාවිද්‍යා ආඥාපණත යටතේ ඉඩකඩ සලසා ඇත. ඒ අනුව එම පුරාවිද්‍යා ඇගයුම් වාර්තාවෙන් තොරව සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක නොකෙරේ.

පුරාවිද්‍යා කටයුතු විමධ්‍යගත කිරීම පිණිස ප්‍රතිසංවිධානය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වරයකු ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු භාරව පත්කර ඇත. අප රටේ ජන උරුමය අනාගත පරපුරට භාරදීමේ භාරදූර වගකීම අප වෙත පැවරී ඇති හෙයින් අපගේ මේ අතීත උරුමය පිළිබඳ ජනතාවට අවබෝධයක් ලබා දීමට ප්‍රමුඛතාව ලබාදීම අපගේ අනාගත පෙර දැක්මේ මූලික අරමුණ වේ. ❑